

# දැයක් අවදි කළ සිංහ නාදය
## මාදුළුවාවේ සෝභිත හිමියනි ඔබට නිවන් සුව

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



# මෛත්‍රී පාලනය පිළිබඳ අපේක්ෂා සහ යථාර්ථය

**ජයතිලක කම්මැල්ලවීර**



පොදු අපේක්ෂකයා ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත්ව ජයගත් මෛත්‍රීපාල සිරිසේන මහතා අප රට යහපත් සදාචාර සම්පන්න රටක් වනු දැකීමට කැමති ජනයාගේ සිත් තුළ සාධනීය අපේක්ෂා දල්වන පොරොන්දු ගණනාවක් දුන් බව අපට මතකය. ඒවා අතර දූෂණ වංචාවලට සම්බන්ධ වූවන්ට පක්ෂය, තරාතිරම නොබලා දඬුවම් දීම සහ රට දූෂණයෙන් වංචාවෙන් හා අපරාධවලින් තොර රටක් බවට පත්කිරීම ප්‍රධාන විය. ඒ සේ ම ජාතීන් අතර සංහිඳියාව ගොඩනැගීම, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, අලුත් ඡන්ද ක්‍රමයක් ඇති කිරීම ස්වාධීන කොමිෂන් සභා පත් කිරීම, යහපත් දේශපාලන සංස්කෘතියක් ඇතිකිරීම ආදී වශයෙන් රාජපක්ෂ පවුල් පාලනය විසින් විනාශයට ගෙනගිය රට වෙනස් කිරීමට අත්‍යවශ්‍ය පියවරයන් ගණනාවක් පිළිබඳ පොරොන්දු ඒ අතර විය.

එම පොරොන්දු ඉටු කිරීම වෙනුවෙන් දින සියයේ වැඩපිළිවෙළ තුළ යම් යම් උත්සාහයන් ගත් බවත් අපි දුටුවෙමු. එසේ ගන්නා ලද උත්සාහයන් පසුබැස්සවීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ බහුතරයක් විසින් විවිධ කඩාකප්පල්කාරී ක්‍රියා දියත් කළ බව ද රටට පෙනුණේය. ඔවුන් විසින් 19වැනි ව්‍යවස්ථා සංශෝධනය බෙහෙවින් බාල කළ බව පැහැදිලි කරුණකි. ඒ කඩාකප්පල්කාරීන්ගෙන් හැකිතරම් පිරිසක් ආණ්ඩුවකට සම්බන්ධ කර ගෙන ඇමතිකම් පිරිනැමීම මගින් ඔවුන් හීලෑකර ගැනීම මහමැතිවරණයෙන් පසු ජනාධිපතිවරයා අනුගමනය කළ උපාය විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලනයේ දීර්ගකාලීන අත්දැකීම්වලින් බිහි වූ එම උපාය යම් පමණකට පළ දරා ඇති බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුළුව ලංකාව සම්බන්ධයෙන් සම්මත කළ යෝජනාව වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ වැඩි දෙනා පෙනීසිටීමෙන් පෙනේ. අදාල කාරණය සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ සමග සිටියදී තමන් දැරූ ස්ථාවරයට සියයට සියයක් ප්‍රතිපක්ෂව ඔවුහු දැන් කතා කරති.

මහින්ද රාජපක්ෂ පවුල් පාලනය විසින් රටේ ආර්ථිකය කාබාසිනියා කර තිබුණු තත්වය තුළ ලෝකයේ බලවත් රටවල ආධාර නොමැතිව ඒ ආර්ථික

12 වන පිටට